අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/4/58/06/01/12
ඔබේ යොමුව / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } 2024.05.

සම්මුඛ පරීක්ෂණ අංකය :....................

සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංකය: 01

....................................................................... හිමි/මයා/මිය/මෙය

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත බඳවා ගැනීම 2020/2021(2022)</u>**

අංක: 1928/28 හා 2015.08.21 දිනැති ගැසට් පත්‍රයේ පළකර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව 2022.03.26 දින පවත්වන ලද සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට හිමි ලකුණු අනුව, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වමි.

02. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා බත්තරමුල්ල, පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 02 වන මහලේ අධ්‍යාපන සේවා ආයතන අංශය වෙත ....................... දින පෙ.ව .................. ට පෙර පැමිණෙන ලෙස කාරුණිකව දන්වමි.

03. එදිනට පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් ඇතුළත් ගොනුවක් ද, එම ලිපි ලේඛනයන්හි සහතික කරන ලද ඡායා පිටපත් ඇතුලත් කර ඊට අනුරූපී ගොනුවක් ද, ඉහතින් දක්වා ඇති සම්මුඛ පරීක්ෂණ අංකය සහ මණ්ඩල අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. සියලුම සහතිකපත්‍ර/ ලේඛන පිටපත් මත ඒවා සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතු අතර, අයදුම්කරු විසින් ද ඒ බව සහතික කර තිබිය යුතුය.

I. සම්මුඛ පරීක්ෂණ කැඳවීමේ ලිපිය
II. ජාතික හැඳුනුම්පත /විදේශ ගමන් බලපත්‍රය
III. උප්පැන්න සහතිකය
IV. දිවුරුම් ප්‍රකාශය (අවශ්‍යතාවය අනුව) - අදාළ අධ්‍යාපන සහතික සහ අනෙකුත් සහතික/ ලේඛනවල සඳහන් නම්වල වෙනස්කම් පවතී නම් ඊට අදාළ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.
V. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම ස්ථිර කරන ලද ලිපිය

VI. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියට උසස්වීමේ ලිපිය

VII. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියේ වැඩ භාරගත් ලිපිය හා ලොග් සටහන් පිටපත

VIII. සම්පූර්ණ කරන ලද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද ආකෘතිපත්‍රය (ඇමුණුම 01 අනුව)

04. අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතු අතර ලිඛිත විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු වේ.

05. අංක 2,231 හා 2021.06.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති බඳවා ගැනීමේ නිවේදනය සහ ඔබගේ අයදුම්පත්‍රය අනුව මූලික සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සියලුම සහතිකපත්/ ලේඛන සහ සහතික කරන ලද ඡායා පිටපත් එදිනට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර පසුව ඉදිරිපත් කෙරෙන සහතිකපත්/ ලේඛන පිළිබඳව සලකා බලනු නොලැබේ.

06. මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම මත පමණක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබීම සඳහා හිමිකම් නොලබන බවත්, බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ 8.3.1 ට අනුව මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන බවත්, කාරුණිකව දන්වමි.

07. තවද, මෙම ලිපිය ලද වහාම සතියේ දිනයන්හි රාජකාරි වේලාවක දී 0112-787330 යන දුරකථන අංකයට ඇමතුමක් ලබා දෙමින් ලිපිය ලද බව තහවුරු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

08. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

ආර්.ඩී. ජමින්ද
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)

අත්.කළෝ: ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්

**අවධානයට:** නියමිත දින මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින් එවැනි ඉල්ලීම් සලකා නොබලන අතර, අදාළ ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අවස්ථාවේ දී අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.